**බිබිල ප්‍රාදේශීය සභාව - 2021**

---------------------------------

## 1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 1.1 <u>තත්ත්වාගණනය කළ මතය</u>

බිබිල ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට බිබිල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 <u>තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම</u>

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්</u>

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 <u>විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)</u>

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව බිබිල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6** **මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1** **ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවට නීත්‍යානුකූලව අයිතිය හිමිව තිබුණු විකුණුම් වටිනාකම රු. 600,000 ක් වූ බිබිල රෝහල ඉදිරිපිට ඉඩම සහ රු. 1,000,000 ක් වූ බෝගහලන්ද ඉඩමේ වටිනාකම් ගිණුම්ගතකර නොතිබුණි. | 2022 වර්ෂයේ ගිණුම සකස් කරන විට නිවැරදි කරන බව දන්වා ඇත. | සභාව සතු සියලුම ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සභාවට අයත් කුලියට දී ඇති කඩකාමර වලින් අයවිය යුතු රු. 32,500 ක කඩකුලී සහ රු. 66,000 ක ප්‍රමාද ගාස්තු අයකර ගැනීම සඳහා නඩු 03 ක් පවරා තිබුණද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල ඒ බව හෙළිදරව් කර නොතිබුණි. | 2022 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන සකස් කරන විට හෙළිදරව් කළ යුතු සියලු දෑ හෙළිදරව් කරන බව දන්වා ඇත. | මූල්‍ය ප්‍රකාශන පරිශීලකයින්ට දැන ගැනීම සඳහා අවශ්‍ය වන සියලු කරුණු හෙළිදරව් කළ යුතුය. |
| (ඇ) | ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොළිය ගිණුම්ගත කිරීමේ දී රු. 62,691 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබීමෙන් අතිරික්තය හා ලැබිය යුතු පොළිය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 2022 වර්ෂයේ ගිණුම සකස් කරන විට නිවැරදි කරන බව දන්වා ඇත. | පොලී ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගතකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ඉකුත් වර්ෂයේදී ප්‍රාදේශීය සභාව ජාලගත කිරීමේ ව්‍යාපෘතිය සඳහා මිල දීගෙන තිබුණු රු. 1,287,500 ක් වටිනා උපකරණ යන්ත්‍ර හා උපකරණ යටතේ ගිණුම්ගත කිරීම වෙනුවට අස්පෘශ්‍ය වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | 2022 වර්ෂයේ ගිණුම සකස් කරන විට නිවැරදි කරන බව දන්වා ඇත. | වත්කම් නිවැරදිව වර්ගීකරණය කර ගිණුම් ගතකළ යුතුය. |
| (ඉ) | මහජන පුස්තකාලවලට පරිත්‍යාග ලෙස ලැබී තිබුණු ටැබ් පරිගණක 06 ක් සහ පුස්තකාල පොත් 503 ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | 2022 වර්ෂයේ ගිණුම සකස් කරන විට නිවැරදි කරන බව දන්වා ඇත. | සභාව සතු සියලුම වත්කම්වල වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ රු. 310,504 ක් වැයකර ප්‍රාදේශීය සභාවේ ගබඩාවට දොරක් සහ ගබඩා කාමරයේ රාක්ක සවිකිරීමේ වියදම ඉඩම් හා ගොඩනැගිලි යටතේ සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීම යන ගිණුම් යටතේ දක්වා නොතිබුණි. | 2022 වර්ෂයේ ගිණුම සකස් කරන විට නිවැරදි කරන බව දන්වා ඇත. | ප්‍රාග්ධන වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (උ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේශීය ණය සංවර්ධන අරමුදලට ගෙවිය යුතු මුදල රු. 5,759,144 ක් ජංගම නොවන වගකීම් ලෙස දක්වා තිබුණද එම මුදලින් 2022 වර්ෂය වෙනුවෙන් ගෙවිය යුතු රු. 3,005,026 ක් ජංගම වගකීම් යටතේ වෙන්කර ගිණුම් ගතකර නොතිබුණි. | 2022 වර්ෂයේ ගිණුම සකස් කරන විට නිවැරදි කරන බව දන්වා ඇත. | ජංගම නොවන සහ ජංගම වගකීම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගතකළ යුතුය. |
| (ඌ) | 2021 වර්ෂය වෙනුවෙන් අයවිය යුතු හිඟ ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු ලෙස රු. 131,100 ක් ගිණුම්වල ගැලපීම් කර නොතිබීමෙන් අතිරික්තය හා ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 2022 වර්ෂයේ ගිණුම සකස් කරන විට නිවැරදි කරන බව දන්වා ඇත. | හිඟ ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගතකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (එ) | සමාලෝචිත වර්ෂයේ දී රු. 221,051 ක් වැය කර පොදු වෙළඳපලේ කඩකාමරයක් ඉදිකිරීමේ වියදම ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට අයභාර වියදම් ලෙස ගිණුම්ගත කර තිබීමෙන් එම ප්‍රමාණයෙන් අතිරික්තය හා ජංගම නොවන වත්කම් අඩුවෙන් දක්වා තිබුණි. | 2022 වර්ෂයේ ගිණුම සකස් කරන විට නිවැරදි කරන බව දන්වා ඇත. | වියදම් නිවැරදිව වර්ගීකරණය කර ගිණුම් ගත කළ යුතුය. |
| (ඒ) | සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතුව පැවති නමුදු 2022 වර්ෂයේ ගෙවන ලද රු. 147,776 ක ණය මුදල ණය හිමියන් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | 2022 වර්ෂයේ ගිණුම සකස් කරන විට නිවැරදි කරන බව දන්වා ඇත. | ණයහිමියන් නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුය. |
| (ඔ) | සමාලෝචිත වර්ෂයේ දී බිබිල පොදු වෙළඳපොළ වැඩිදියුණු කිරීම වෙනුවෙන් වැයකර තිබුණු රු. 396,000 ක් ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම් ගත කිරීම වෙනුවට අයභාර වියදම් ලෙස ගිණුම්ගත කර තිබීමෙන් අතිරික්තය හා වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 2022 වර්ෂයේ ගිණුම සකස් කරන විට නිවැරදි කරන බව දන්වා ඇත. | වියදම් නිවැරදිව වර්ගීකරණය කර ගිණුම්ගත කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 34,675,308 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 14,646,526 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ------------------------ | ------------------------------------- | ---------------- |
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු රු. 1,541,054 ක් අයකරගෙන නොතිබුණි. | කොවිඩ් වසංගතය නිසා රට වසා දැමීම හේතුවෙන් ක්ෂේත්‍රයට ගොස් මුදල් අයකර ගැනීමට නොහැකි වූ බ ව දන්වා ඇත. | හිඟ පරිපනම් බදු කඩිනමින් අයකර ගත යුතුය. |
| (ආ) සභාව සතු කඩ කාමර 21 කින් සමාලෝචිත වර්ෂයට අදාලව අයවිය යුතු රු. 1,229,017 ක කඩ කාමර කුලී අයකරගෙන නොතිබුණි. | හිඟ කඩකාමර කුලී අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | හිඟ කුලී කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඇ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 වගන්තියට අනුකූල නොවන ලෙස සභාව සතු දේපල බදු දීමෙන් 2007 වර්ෂයේ සිට පැවත එන රු. 45,664 ක්, 2019 වර්ෂයට අදාළව රු. 262,547 ක් හා සමාලෝචිත වර්ෂය සඳහා රු. 2,777,859 ක බදු මුදල් අයකරගෙන නොතිබුණි. | බදුකරුවන් 09 දෙනෙකු වෙත නඩු පවරා ඇති බවත් අනෙකුත් හිඟ මුදල් ඉදිරියේදී අයකර ගන්නා බවත් දන්වා ඇත. | උසාවි නියෝග අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) සභා බලප්‍රදේශයේ ස්ථාපිත කර තිබුණු ප්‍රචාරක දැන්වීම් පුවරු 06 ක් වෙනුවෙන් 2020 වර්ෂයට අදාලව අයවිය යුතු රු. 86,850 ක් සහ සමාලෝචිත වර්ෂය සඳහා දැන්වීම් පුවරු 08 ක් වෙනුවෙන් රු. 87,900 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ මුදල් ඉදිරියේ දී අයකර ගන්නා බව දන්වා ඇත. | ආදායම් පරීක්ෂක නිලධාරීන් විසින් සමීක්ෂණ කටයුතු සිදුකර දැන්වීම් පුවරු හඳුනාගෙන ගාස්තු අයකරගත යුතුය. |